# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/02/2026
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026-06-30

**ජාතික අයවැය චක්‍රලේඛ: 02/2026**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
විශේෂ වියදම් ඒකක හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්,

**අයවැය කැඳවීම- 2027**
**මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2027 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

## 1. හැඳින්වීම

එළැඹෙන 2027 මූල්‍ය වර්ෂයේ වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම පිළිබඳ මාර්ගෝපදේශ, රාජ්‍ය මූල්‍ය පරාමිතීන් සහ අයවැය සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබා දෙමින්, 2027 වර්ෂයේ අයවැය කැඳවීමේ චක්‍රලේඛය, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 22 වැනි වගන්තියට අනුකූලව මෙයින් නිකුත් කරනු ලැබේ.

2027 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී, රජය විසින් අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා අරමුණු, වියදම් ප්‍රමුඛතාගත කිරීම සහ රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව වෙන් කිරීම පිළිබඳ නිසි සැලකිල්ලක් සහිතව, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයේ (Fiscal Strategy Statement) අන්තර්ගත, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට (Medium Term Fiscal Framework) අනුකූලව කටයුතු කළ යුතු ය.

ඒ අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් වැය දරන ආයතන, මෙම චක්‍රලේඛය සහ පහත සඳහන් ලේඛනවල විධිවිධානවලට අනුකූලව තම අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතු ය. මෙම ලේඛන, මහා භාණ්ඩාගාරයේ වෙබ් අඩවියෙන් (www.treasury.gov.lk) බාගත කර ගත හැකි ය.

- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව, පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය 2027
- රාජ්‍ය ආයෝජන වැඩසටහන (Public Investment Programme)
- මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සැලකිල්ලට ගනිමින් 2027 වර්ෂය සඳහා අමාත්‍යාංශවලට අදාළව තීරණය කළ අනිවාර්ය මූලික වියදම් සීමාවන් [Binding Baseline Expenditure Ceilings) **(ඇමුණුම I)**

## 2. 2027 වර්ෂය සඳහා වන වියදම් සීමාවන්

මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2026-06-11 දිනැති අංක BD/CBP/01/01/23/2026 දරන ලිපිය අනුව වැය දරන ආයතන විසින් ඇස්තමේන්තු කර, දැනටමත් ඉදිරිපත් කර ඇති, "පදනම් ඇස්තමේන්තු" සැලකිල්ලට ගෙන ගණනය කරන ලද අනිවාර්ය වියදම් සීමාවන්, **ඇමුණුම I** හි දක්වා ඇත.

ඇමුණුම I හි නිශ්චිතව දක්වා ඇති වියදම් සීමාවන් මඟින්, 2027 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී, යොදා ගත හැකි උපරිම සම්පත් ප්‍රමාණය දැක්වේ. ඒ අනුව, අමාත්‍යාංශ විසින් සියලුම පුනරාවර්තන වියදම්

සහ දැනට ක්‍රියාත්මක වන වැඩසටහන්වලට අදාළ වියදම් බැඳීම්, අනුමත පදනම් වියදම් සීමාවන් තුළ පවත්වා ගැනීමට වගබලා ගත යුතු ය.

රාජ්‍ය ආයෝජන වැඩසටහනෙහි ඇතුළත් වන නව **සංවර්ධන ව්‍යාපෘතියක්, වැඩසටහනක්, ක්‍රියාකාරකමක්, සේවාවක් හෝ ප්‍රතිපත්තිමය මූලාරම්භයක්** (policy initiative) සම්බන්ධයෙන් වන ඕනෑම යෝජනාවක්, පදනම් අයවැය ඇස්තමේන්තුවලින් වෙන් කොට වෙනම ඉදිරිපත් කළ යුතු අතර, එවැනි යෝජනා ඇමුණුම I හි දක්වා ඇති වියදම් සීමාවන් තුළට ඇතුළත් නොකළ යුතු ය. එම යෝජනා, ජාතික ප්‍රමුඛතාවන්, ක්‍රියාත්මක කිරීම සඳහා පවතින සූදානම සහ 2027 වර්ෂය මෙන්ම මධ්‍යකාලීන කාලසීමාව තුළ පවතින රාජ්‍ය මූල්‍ය අවකාශයට යටත්ව සලකා බලනු ලැබේ.

නව වියදම් මූලාරම්භයක් (new expenditure initiative) සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ දී, මෙම චක්‍රලේඛයේ 3.2 ඡේදයේ දක්වා ඇති උපදෙස්වලට දැඩි ලෙස අනුගතව කටයුතු කරන මෙන් අමාත්‍යාංශ වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

## 3. විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු සකස් කර අවසන් කිරීම සඳහා වන මාර්ගෝපදේශ

### 3.1. අයවැය සීමාවන් අදාළ කරගැනීම

2027 වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ඇමුණුම I හි දක්වා ඇති වියදම් සීමාවන් දැඩි ලෙස අනුගමනය කළ යුතු ය. මේ සම්බන්ධයෙන්, පහත සඳහන් උපදෙස්වලට අනුකූල වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහතික විය යුතු ය.

i. **අනුමත කරන ලද අයවැය වියදම් සීමාව අනුගම්‍ය (ඉක්මවිය නොහැකි) වන අතර**, එය අදාළ අමාත්‍යාංශය, ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා වෙනත් වැය දරන ආයතන සහ විශේෂ වියදම් ඒකකවල දැනට ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්, වැඩසටහන්, ව්‍යාපෘති සහ සේවාවන් මූල්‍යයනය කිරීම සඳහා පමණක් උපයෝජනය කළ යුතු ය.

ii. 2026-06-11 දිනැති අංක BD/CBP/01/01/23/2026 දරන මහාභාණ්ඩාගාර ලිපියට පිළිතුරු වශයෙන් දැනටමත් ඉදිරිපත් කර ඇති "පදනම් අයවැය ඇස්තමේන්තු" සමඟ සලකා බලා, එක් එක් වැය ශීර්ෂය සඳහා අවසාන අයවැය ඇස්තමේන්තු සකස් කිරීම පිණිස අවශ්‍ය මඟපෙන්වීම **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්** විසින් වගකිව යුතු නිලධාරීන් වෙත ලබා දිය යුතු ය.

iii. වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප් දායක මුදල්, නොගෙවූ අතැති බිල්පත්, කුලී, වරිපනම් සහ බදු, විදුලිය, ජලය හා දුරකථන බිල්පත් වැනි උපයෝගිතා ගාස්තු මෙන්ම අනෙකුත් නොවැළැක්විය හැකි අනිවාර්ය බැඳීම් ඇතුළුව, **ව්‍යවස්ථාපිත හා ගිවිසුම්ගත බැඳීම් සහ අනෙකුත් ස්ථාවර වියදම් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.**

iv. වීරමොං පටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරුකිරීම්, පරිපූරක ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වර්ෂය තුළ සිදු කළ යුතු වෙනත් අයවැය ගැළපීම් සඳහා වන අවශ්‍යතා අවම කර ගැනීම පිණිස **සියලුම අභිමතානුසාරී නොවන වියදම් අයිතම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළ යුතු ය.**

v. **දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සහ නිම වීමට ආසන්න** මෙන්ම සාධාරණ කාල සීමාවක් තුළ ප්‍රත්‍යක්ෂ ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ අත්කර දිය හැකි **ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.**

vi. ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු, රේගු නිෂ්කාශන සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඇතිවිය හැකි ප්‍රමාද වීම් වැළැක්වීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යාපෘති විසින් ගෙවිය යුතු රේගු බදු, බදු, අයබදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගාස්තු ඇතුළුව **බදු සම්බන්ධ සියලුම වියදම් සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කළ යුතු ය.**

vii. **බහු වාර්ෂික ගිවිසුම්ගත සහ මූල්‍යමය බැඳීම් (multi-year contractual and financial commitments) ප්‍රවේශමෙන් සමාලෝචනය කර**, අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ

කාලරාමු සහ කොන්ත්‍රාත් විධිවිධානවලට අනුකූලව 2027 වර්ෂයේ දී ගෙවීම් කිරීමට නියමිත බැඳීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළ යුතු ය.

viii. අනුමත වියදම් සීමාව තුළ වියදම් රටාවන් සමාලෝචනය කර, **කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, පිරිවැය ඉතිරි කිරීම සහ** අඩු ප්‍රමුඛතාවක් සහිත ක්‍රියාකාරකම්වලින් ඉහළ ප්‍රමුඛතාවක් සහිත වැඩසටහන් වෙත **සම්පත් විතැන් කිරීම** සඳහා පවතින අවස්ථා හඳුනාගැනීමට අමාත්‍යාංශ කටයුතු කළ යුතු ය.

### 3.2. නව ව්‍යාපෘති තේරීමේ ක්‍රමවේදය

i. **නව ව්‍යාපෘති යෝජනා, රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) යටතේ ඇතුළත් ව්‍යාපෘති අතරින් තෝරාගත යුතු ය.** අමාත්‍යාංශ විසින් මධ්‍යකාලීන අයවැය රාමුව සඳහා ඇතුළත් කිරීම පිණිස රාජ්‍ය ආයෝජන වැඩසටහන තුළ ලැයිස්තුගත ව්‍යාපෘති යෝජනා හඳුනාගෙන ඒවා ප්‍රමුඛතාගත කළ යුතු ය. රාජ්‍ය ආයෝජන වැඩසටහන, මහා භාණ්ඩාගාරයේ (www.treasury.gov.lk) වෙබ් අඩවිය වෙතින් බාගත කළ හැකි ය.

ii. අමාත්‍යාංශ විසින් 2027–2029 කාලසීමාව තුළ ආරම්භ කිරීමට යෝජිත නව ව්‍යාපෘතිවල ලැයිස්තුව දැක්වෙන ඇමුණුමක්, අයවැය ඇස්තමේන්තු සමඟ වෙනම ඉදිරිපත් කළ යුතු ය. එක් එක් ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද **ඇමුණුම IV – නව ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රය** සහ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සූදානම (project readiness) සනාථ කිරීමට අවශ්‍ය අනෙකුත් ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ සූදානම සම්බන්ධයෙන් නියමිත නිර්ණායක සපුරාලන ව්‍යාපෘති පමණක් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වගබලා ගත යුතු ය.

iii. මුදලට සරිලන සහ දිගුකාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය අත්වන බවට සහතික වන අතරම ආර්ථික වර්ධනය, අපනයන වර්ධනය, ඩිජිටල් පරිවර්තනය, දේශගුණික ඔරොත්තුදීමේ හැකියාව ඉහළ නැංවීම සහ වැඩිදියුණු කළ රාජ්‍ය සේවා සැපයීම සඳහා සෘජුවම දායක වන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබා දීමට අමාත්‍යාංශ දිරිමත් කෙරේ.

iv. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරව, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම යෝජිත ව්‍යාපෘති, ව්‍යාපෘතියේ ක්‍රමෝපායික අදාළත්වය, ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ, ක්‍රියාත්මක කිරීමේ සූදානම, මූල්‍යමය වශයෙන් දැරීමේ හැකියාව සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ අනුකූලතාවය ඇතුළු අනුමත ව්‍යාපෘති තේරීමේ නිර්ණායකයන්ට අනුකූලව, **රාජ්‍ය ආයෝජන කමිටුව** විසින් සමාලෝචනය කරනු ලබන බව විශේෂයෙන් සැලකිය යුතු ය. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට ව්‍යාපෘති ඇතුළත් කිරීම, රාජ්‍ය ආයෝජන කමිටුවේ නිර්දේශ, රාජ්‍ය මූල්‍ය සීමාවන්, රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සහ පවතින සම්පත් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් තීරණය කරනු ලැබේ.

### 3.3. අත්තිකාරම් ගිණුම් කටයුතු

i. **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වලට** අදාළ අයවැය ඇස්තමේන්තු මෙම චක්‍රලේඛයේ **ඇමුණුම III** හි දක්වා ඇති ආකෘතියට අනුකූලව සකස් කර ඉදිරිපත් කළ යුතු ය.

ii. ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු, වර්ෂය තුළ ලබා දීමට නියමිත අත්තිකාරම්, වර්ෂය තුළ අපේක්ෂිත අයකරගැනීම් සහ මූල්‍ය වර්ෂය ආරම්භයේ සහ අවසානයේ ඇස්තමේන්තුගත හිඟ ශේෂයන් පිළිබඳ යථාර්ථවාදී තක්සේරු කිරීම් මත පදනම් විය යුතු ය.

iii. **වාණිජ අත්තිකාරම් ගිණුම්** පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඇස්තමේන්තුගත ලැබීම්, වියදම්, මෙහෙයුම් ප්‍රතිඵල, මුදල් ප්‍රවාහ, වත්කම්, වගකීම් සහ අනෙකුත් අදාළ මූල්‍ය දර්ශක පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සපයමින්, සුදුසු ආකෘතියකින්, අදාළ ඇස්තමේන්තු වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.

## 4. සියලුම වැය දරන ආයතන සඳහා පොදු කරුණු

### 4.1. දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිචාරාත්මකභාවය

අයවැය තුළ දේශගුණික විපර්යාස ආශ්‍රිත වියදම් සම්බන්ධයෙන් ගැළපීම් කිරීම (tagging on climate related expenditure) සඳහා **ඇමුණුම V** සම්පූර්ණ කර, ඔබගේ අයවැය ඉදිරිපත් කිරීමත් සමඟ යොමු කළ යුතු ය. එවැනි වියදම් කිසිවක් නොමැති විට, ශුන්‍ය වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

### 4.2. තිරසර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන සභා වෙබ් අඩවියෙන් (https://sdc.gov.lk/) බාගත කළ හැකි මාර්ගෝපදේශ අනුගමනය කරමින්, තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ අදාළ වියදම් වර්ගීකරණය (tagging of expenditure with Sustainable Development Goals) සිදු කිරීමට අවශ්‍ය වේ.

### 4.3. වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලසුම් ඉදිරිපත් කිරීම

නිශ්චිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ලබා දී ඇතත්, බොහෝ අවස්ථාවල දී ප්‍රසම්පාදන අවශ්‍යතා, මූල්‍ය වර්ෂයේ අවසාන කාලය දක්වා හඳුනා නොගැනීම හේතුවෙන්, වෙන් කළ ප්‍රතිපාදනවල ඌණ උපයෝජනයක් සිදු වන බව නිරීක්ෂණය කර ඇත. එබැවින්, සියලුම වැය දරන ආයතන විසින් අයවැය ප්‍රතිපාදන ඉල්ලා සිටින නිශ්චිත ක්‍රියාකාරකම්, නිමවුම් සහ ආශ්‍රිත ප්‍රසම්පාදන අවශ්‍යතා පැහැදිලිව හඳුනාගත යුතු ය. ඒ අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.1.2 ඡේදයෙහි සහ භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන අත්පොතේ 04 වන පරිච්ඡේදයේ ඇමුණුම II හි සඳහන් වන පරිදි, සියලුම වැය දරන ආයතන විසින් වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම සහ අදාළ සනාථ කිරීමේ ලියකියවිලි, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත, 2027 වර්ෂය සඳහා වියදම් යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

## 5. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙම චක්‍රලේඛයේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම කෙරෙහි සියලුම වැය දරන ආයතන විසින් සිය ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු ය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද සියලුම ඇමුණුම්, 2026 ජූලි 31 වන දින හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට උපදෙස් දෙනු ලැබේ.

ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා සිදු කළ යුතු අතර, වියදම් ඇස්තමේන්තු සඳහා 2027EXP_ES සැලසුම් පිටපත (version) ද අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු සඳහා 2027ADV_ES සැලසුම් පිටපත (version) ද භාවිත කළ යුතු වේ. 2027-2029 වර්ෂ සඳහා වන මධ්‍ය කාලීන අයවැය රාමුවට අනුකූල වන සේ, 2027 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ 2028 සහ 2029 වර්ෂ සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

ඊට අමතරව, වියදම් ඇස්තමේන්තු සහ සියලුම අදාළ ඇමුණුම්වල දෘඩ සහ මෘදු පිටපත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS Helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු ය.

## 6. ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

2027 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් අවශ්‍ය පරිදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් යථා කාලයේ දී නිකුත් කරනු ඇත.

## 7. අයවැය සාකච්ඡා

වැය දරන ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තුවලට අනුව, ගැටළු හඳුනා ගැනීම, ප්‍රමුඛතා ස්ථාපනය කිරීම සහ ඇස්තමේන්තු සඳහා අවශ්‍ය වන සංශෝධන සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මුදල් අමාත්‍යවරයාගේ/ භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් වැය දරන ආයතන සමඟ අයවැය සාකච්ඡා සංවිධානය කරනු ඇත. මෙම අයවැය සාකච්ඡා, 2026 අගෝස්තු මාසයේ දී පැවැත්වීමට නියමිත ය.

## 8. පැහැදිලි කිරීම්

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන විෂය භාර මාණ්ඩලික නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන්න.

**අත්.කළේ/ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
- i. ජනාධිපති ලේකම්
- ii. අග්‍රාමාත්‍ය ලේකම්
- iii. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
- iv. විගණකාධිපති
- v. ලේකම්, මුදල් කොමිෂන් සභාව